# පුවත් පත් නිවේදනයයි

## 2010 වර්ෂය තුල රක්ෂණ කර්මාන්තයේ සිදු වූ ප්‍රගතිය

රක්ෂණ කර්මාන්තය නියාමනය හා අධීක්ෂණය කිරීමේ අරමුණින් වර්ෂ 2000 ක් වූ අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතන් පිහිටුවා ඇති ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයෙ' නිසි මග පෙන්වීම හා අධීක්ෂණය යටතේ 2010 වසරේ රක්ෂණ කර්මාන්තය ඉහළ ප්‍රගතියක් පෙන්වා ඇත. ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරයෙ' ගෞරවයද, රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාවද සුරැකෙන අයුරින් ක්‍රියාකිරීම රක්ෂණ මණ්ඩලයේ අරමුණ හා වගකීම වේ.

2010 වසර අවසාන වන විට රක්ෂණ සමාගම් 19ක් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇත. මෙයින් සමාගම් 12 ක් ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ යන ව්‍යාපාර දෙවර්ගයේම නියැලී සිටින අතර සමාගම් 05 ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පමණක් කරන අතර, සමාගම් 02 ජීවිත රක්ෂණ ව්‍යාපාර වල පමණක් කටයුතු කරයි.

2010 වර්ෂය තුළ ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල දළ ලිඛිත වාරික ආදායම (Overall Gross Written Premium/GWP) රු. මිලියන 68,493.345 වූ අතර එය 2009 වර්ෂය හා සැසඳීමේදී 19.63% වර්ධනයක් පෙන්වයි. 2009 වර්ෂයේ දළ ලිඛිත වාරික ආදායම වූයේ රු.මිලියන 57,252 කි. මෙය ජීවිත රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය ලෙස පහත දැක්වෙන ආකාරයට වෙන්වෙන්ව බැලීමේදී ද 2010 වර්ෂය තුළ ආදායම් වර්ධනයක් පෙන්වා ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල දළ ලිඛිත වාරික ආදායම රු.මිලියන 37,342.19 (එය 2009 දී රු.මිලියන 33,485කි) ජීවිත රක්ෂණ ව්‍යාපාර දළ ලිඛිත වාරික ආදායම රු.මිලියන 31,151.155 (එය 2009 දී රු.මිලියන 23,767කි)

| වර්ෂය | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|
| ජීවිත රක්ෂණ ව්‍යාපාරය | 17,104 | 20,729 | 23,613 | 23,767 | 31,151.16 |
| සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය | 25,931 | 31,156 | 34,553 | 33,485 | 37,342.19 |
| **මුළු දළ ලිඛිත වාරික ආදායම** | **43,035** | **51,885** | **58,166** | **57,252** | **68,493.35** |

ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල දළ ලිඛිත වාරික ආදායම (රු. මිලියන)



ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම් වල මුළු වත්කම් ප්‍රමාණය 2010 වර්ෂය තුළ ඉහළ ගොස් ඇත. එය රු.මිලියන 222,242.799 කි. 2009 වසර අවසානයේ මුළු වත්කම් ප්‍රමාණය රු.මිලියන 181,044.917 කි.

| වර්ෂය | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|
| මුළු වත්කම් ප්‍රමාණය (රු.'000) | 117,658,799 | 134,876,221 | 155,993,677 | 181,044,917 | 222,242,799 |

රක්ෂණ සමාගම් වල මුළු වත්කම් ප්‍රමාණය




රක්ෂණ සමාගම් වල වත්කම් වල යම් ප්‍රතිශතයක් රජයේ සුරැකුම් පත්වල (Government Securities) ආයෝජනය කිරීම නීතිමය අවශ්‍යතාවයකි. එනම් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල වත්කම් ඇතුලත් තාක්ෂණික සංචිතයේ (Technical Reserve) අරමුදලින් 20% රජයේ සුරැකුම් පත්වල ආයෝජනය කළ යුතුය. මේ අනුව පසුගිය වසර තුළ 23.70% (රු.මිලියන 19.584.153) රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කර ඇත. ඒ සමානව ම ජීවිත රක්ෂණ අරමුදල් වලින් 30% රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කළ යුතු අතර, එය 50.19% ක් දක්වා ආයෝජනය කර තිබේ. (රු.මිලියන 70,050.073)

2010 වර්ෂය තුළ රක්ෂණ සමාගම් විසින් නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාවේ වර්ධනයක් ද පෙන්නුම් කර තිබේ. 2010 වර්ෂය තුළ ජීවිත රක්ෂණ ඔප්පු 503,543 ක් නිකුත් කර ඇති අතර එය 2009 වර්ෂයේ 464,249 කි. ජීවිත රක්ෂණ ව්‍යාප්තිය 10.9% දක්වා වර්ධනය වී ඇත.

| වර්ෂය | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|
| නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු | 409,933 | 527,385 | 555,886 | 464,249 | 503,543 |
| ජීවිත රක්ෂණ ව්‍යාප්තිය | 8.8 | 9.6 | 10.4 | 10.4 | 10.9 |

ජීවිත රක්ෂණ ව්‍යාප්තිය මුළු ජනගහණයේ % ක් ලෙස

රක්ෂණ සමාගම් වල ක්‍රියාකාරීත්වයට අමතරව රක්ෂණ තැරැව්කරැවන් හා රක්ෂණ නියෝජිතයන් රක්ෂණ කර්මාන්තයේ ප්‍රගතියට අතරමැදියන් (Intermediary) ලෙස වැදගත් කාර්‍ය භාරයක් උසුලයි. 2010 වර්ෂය තුළ රක්ෂණ තැරැව්කාර සමාගම් 41 ක් තබු අතර රක්ෂණ නියෝජිතයන් 37000 ක් පමණ සේවයේ යෙදී සිටි. රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වලින් උපයන ලද දළ ලිඛිත වාරික ආදායම රු.මිලියන 9539.66 ක් වූ අතර එය 2009 වර්ෂයේ රු.මිලියන 8885.67 ක් විය. මෙය 7.36% ක වර්ධනයකි.

| වර්ෂය | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|
| ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වලින් උපයන ලද දළ ලිඛිත වාරික ආදායම (රු.' 000) | 6,171,604 | 7,551,357 | 8,975,654 | 8,885,672 | 9,539,661 |

රක්ෂණ තැරුව්කාර සමාගම් විසින් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වලින් උපයන ලද දළ ලිඛිත වාරික ආදායම




**වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය**
**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය**
2011.04.28